සැ. යු. - 2021.10.29 දින පළ වූ අංක 2252 දරන *ගැසට් පත්‍රයේ* IVඅ කොටස පළ නොවී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,257 - 2021 දෙසැම්බර් මස 03 වැනි සිකුරාදා - 2021.12.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2334 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2342 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණ-වත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 දෙසැම්බර් මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 දෙසැම්බර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2331 - B 82293 — 5,403 (2021/12)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. **සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. **ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. **යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. **රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දූරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. **සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. **බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**විශ්වවිද්‍යාල රෝහල**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය**
**පුරප්පාඩු**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
(පූර්ණ කාලීන ස්ථිර පදනම මත)

1. විශේෂඥ වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය

- විශේෂඥ වෛද්‍ය නිලධාරි කායික රෝග
- විශේෂඥ වෛද්‍ය කායික රෝග බාහිර රෝගී අංශය
- විශේෂඥ වෛද්‍ය හදිසි ප්‍රතිකාර
- විශේෂඥ වෛද්‍ය දැඩි සත්කාර
- විශේෂඥ වෛද්‍ය ළමා හෘද රෝග
- විශේෂඥ වෛද්‍ය රසායනවේදී
- විශේෂඥ වෛද්‍ය වාහිනික වෘක්කවේදී
- විශේෂඥ වෛද්‍ය ආමාශ, ආන්ත්‍රික සහ අක්මා රෝග
- විශේෂඥ වෛද්‍ය ස්නායු රෝග
- විශේෂඥ වාහිනික සෛල වෛද්‍ය
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය (වකුගඩු, අක්මා හා පිත්තප්‍රණාල, බද්ධ කිරීම පිළිබඳ හැකියාව ඇති)
- විශේෂඥ වෛද්‍ය නිලධාරි විකිරණ
- විශේෂඥ වෛද්‍ය නිලධාරි නිර්වින්දන (හෘද සහ උරස් ශල්‍ය නිර්වින්දනය පිළිබඳ වැඩි කැමැත්තක් දක්වනු ලබන)
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය හෘද සැත්කම්
- විශේෂඥ ශල්‍ය වෛද්‍ය මුඛ, හනු, මුහුණු
- විශේෂඥ දන්ත ශල්‍ය වෛද්‍ය දන්ත විකලාංග

*සුදුසුකම්* :

I. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි /ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විය යුතුය.

හෝ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු වීම.

සහ

III. විශේෂඥ වෛද්‍ය (MD / MS) උපාධිය සමග කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාණ්ඩලික සහතිකය (Board Certification) ලබා තිබීම.

(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* I වැනි ඇමුණුම).

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

*වැටුප් පරිමාණය* :

MC 1-2 රු. (91,645 - 12 × 2,700 - 124,045)
*විශේෂඥ වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MC 1-2 පියවර 01 හි තබනු ලැබේ. - රු. 91,645.

2. වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය

*සුදුසුකම්* :

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මකවන ආයතනවල II ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2014.10.11 දින නිකුත් කරන ලද 1883/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* II වැනි ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

*වැටුප් පරිමාණය* :

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)
*වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය
MO 1-1පියවර 14හි තබනු ලැබේ.
රු. 78,585.

3. **වෛද්‍ය නිලධාරි-II ශ්‍රේණිය**

*සුදුසුකම්* :

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

වැටුප් පරිමාණය :

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015.)
*වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 05හි තබනු ලැබේ. - රු. 64,185.00

4. **වෛද්‍ය නිලධාරි-ප්‍රාථමික ශ්‍රේණිය**

*සුදුසුකම්* :

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

වැටුප් පරිමාණය :

MO 1-1 රු.(58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015).
*වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02හි තබනු ලැබේ. - රු. 60,050.00

5. **හෙද පාලිකා - (විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි)**

*සුදුසුකම්* :

I. විශේෂ ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

සහ

II. ජාතික හෙද අධ්‍යාපන ආයතනය/පශ්චාත් ප්‍රාථමික හෙද විද්‍යාලය විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණ හා අධීක්ෂණය/ ඉගැන්වීම සහ අධීක්ෂණය/මහජන සෞඛ්‍ය හෙදකම් හා වින්නඹු කර්මය/ මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ඩිප්ලෝමා පාඨමාලාව හදාරා, I වැනි ශ්‍රේණියේ හෙද නිලධාරි (රෝහල් සේවා, අධ්‍යාපන, මහජන සෞඛ්‍ය) තනතුරක වසර (05) ක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

සහ

III. තෙවැනි කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම.

සහ

IV. පූර්වාසන්නතම වසර පහ (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

V. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීම් දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමකට වඩා ඉහළ කාර්යසාධනයක් පෙන්නුම්කර තිබීම.

වයස් සීමාව :

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය* :

MT 8 - රු. (50,970 - 10 × 1385 - 8 × 1910 - රු. 80,100)

*හෙද පාලිකා - විශේෂ ශ්‍රේණිය MT 8 පියවර 4හි තබනු ලැබේ.- රු. 55,125.

6. හෙද සොහොයුරිය

සුදුසුකම් :

I. I වැනි ශ්‍රේණියේ නිලධරයෙකු වීම.

සහ

II. ජාතික හෙද අධ්‍යාපන ආයතනය / පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණය හා අධීක්ෂණය / ඉගැන්වීම හා අධීක්ෂණය / මහජන සෞඛ්‍ය හෙදකම හා වින්නඹු කර්මය / මානසික හෙදකම අඩංගු අවුරුදු 1 1/2 ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා ඉන් සමත්වූ නිලධරයෙකු වීම.

සහ

III. දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් වී තිබීම.

සහ

IV. පූර්වාසන්නතම වසර (05) තුළ නියමිත වැටුප් වර්ධක සියල්ලම උපයාගෙන තිබීම හා සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

සහ

V. අනුමත කාර්යසාධන පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05) තුළ සතුටුදායක මට්ටමට වඩා ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම.

*වයස් සීමාව :*

අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :*
MT 7 - රු. (33,295 - 10 × 445- 11 × 660 - 10 × 730 - 5 × 750 - රු. 59,805).

*හෙද සොහොයුරිය MT 7 පියවර 23 හි තබනු ලැබේ. - රු. 45,735.

7. **හෙද නිලධාරි**

සුදුසුකම් :

I. සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ උපාධිය සම්පූර්ණකර තිබීම.

සහ

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාග යේදී විද්‍යා විෂය ධාරාවට අයත්, ජීව විද්‍යාව/ ගණිතය/කෘෂි විද්‍යාව විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්වීම, පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්වීම, සහ

III. සිංහල / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් 04ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*වයස් සීමාව :*

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*වැටුප් පරිමාණය :*
MT 7 - රු. (33,295 - 10 × 445- 11 × 660 - 10 × 730 - 5 × 750 - රු. 59,805)
*හෙද නිලධාරි MT 7 පියවර 01හි තබනු ලැබේ. - රු. 33,295.

**පොදු කොන්දේසි :**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන දිවයිනේ ඕනෑම ස්ථානයක හෝ සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

4. අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනය වනවිට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

5. මෙම තනතුර ස්ථිර වන අතර, වෛද්‍ය නිලධාරි ප්‍රාථමික ශ්‍රේණිය හා හෙද නිලධාරි III ශ්‍රේණිය වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, විශේෂඥ වෛද්‍ය නිලධාරි, වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය, වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය, රාජ්‍ය සේවයෙහි රැකියාවෙහි නියුතුව සිටි නිලධාරින් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.

6. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි සංශෝධනවලට යටත්ව).

7. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයක් සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2021.12.17** දිනට හෝ ඊට පෙර "විධායක අධ්‍යක්‍ෂ, විශ්ව විද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට හෝ edassistant_uh@kdu.ac.lk යන විද්‍යුත් තැපැලට යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

8. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

9. අසම්පූර්ණ, ප්‍රමාදවී ලැබුණු සහ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. අයදුම්පත් භාගත කර ගැනීමට / වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්‍ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.

www.kdu.ac.lk

ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික),
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

12-346

---

## සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

### තනතුරු පුරප්පාඩු

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු ගණන |
|---|---|
| නිශ්චල ඡායාරූප ශිල්පී | 01 |
| වීඩියෝ කැමරා ක්‍රියාකරු | 01 |
| ශ්‍රව්‍ය/දෘශ්‍ය සංස්කරණ ශිල්පී | 01 |

02. *සේවයේ නියුක්ත කිරීම සහ සේවා කොන්දේසි*

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරු සඳහා හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ.

වැටුප් කේත අංකය : MT 01-2016
වැටුප් පරිමාණය : රු. 29,840-10x300-11x350-10x560-10x660-රු.48,890

03. *සුදුසුකම්*

I. *අධ්‍යාපන සුදුසුකම්* : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

II. *වෘත්තීය සුදුසුකම්* :

1. නිශ්චල ඡායාරූප ශිල්පී - ඡායාරූපකරණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) මට්ටම 05ට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම.
2. වීඩියෝ කැමරා ක්‍රියාකරු - වීඩියෝ කැමරාකරණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) මට්ටම 05ට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම.
3. ශ්‍රව්‍ය/දෘශ්‍ය සංස්කරණ ශිල්පී - ශ්‍රව්‍ය/දෘශ්‍ය සංස්කරණය පිළිබඳව ජාතික වෘත්තීය සුදුසුකම් (N.V.Q) මට්ටම 05ට නොඅඩු පාඨමාලාවක් හදරා සහතික ලබා තිබීම.

iii. *පළපුරුද්ද* : අදළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

iv. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

v. *වෙනත් සුදුසුකම්* :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන අනු අංක 03 හි සඳහන් සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

04. *වයස් සීමාව* : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

1. සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන පරිදි යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක හා වෘත්තීය පරීක්ෂණයක නිර්දේශ මත බඳවා ගනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් හා වෘත්තීය පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

➢ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. *අතිරේක අධ්‍යාපන සුදුසුකම්*<br>● අ.පො.ස. සාමාන්‍ය පෙළ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයන් හය (06) ක් සමත්වීම.<br>එම විෂයයන්ට අමතරව සමත්වී ඇති විෂයයන් අනුව-<br>1. අ.පො.ස. සා/පෙළ විෂයයන් සඳහා - ලකුණු 10<br>2. අ.පො.ස. උ/පෙළ විෂයයන් සඳහා - ලකුණු 10 | 20 | අදාල නොවේ |
| 2. *අතිරේක වෘත්තීය සුදුසුකම්*<br>● රැකියා ක්ෂේත්‍රයට අදළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 මට්ටමේ සුදුසුකම. එයට අමතර ක්ෂේත්‍රයට අදළ වෙනත් වෘත්තීය සහතික සඳහා<br>1. ජාතික වෘත්තීය කුසලතා සහතික, ඩිප්ලෝමා ආදී | 25 | |
| 3. *වෘත්තීය පළපුරුද්ද*<br>● ඉල්ලුම් කරන ක්ෂේත්‍රයට අදළව ලබා ඇති වෘත්තීය පළපුරුද්ද සඳහා වසරකට 3 බැගින් වසර 10ක් සඳහා | 30 | |
| 4. *තොරතුරු තාක්ෂණය/පරිගණක හැකියාව පිළිබඳ සුදුසුකම්*<br>තොරතුරු තාක්ෂණය/පරිගණක හැකියාව පිළිබඳ ලබා ඇති සහතික පත්‍ර පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා හෝ උසස් ඩිප්ලෝමා පාඨමාලා සඳහා | 10 | |
| 5. *භාෂා ප්‍රවීණතාවය*<br>භාෂා ප්‍රවීණතාවය පිළිබඳව ලබා ඇති සහතික පත්‍ර පාඨමාලාවක්, ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | 10 | |
| 6. *සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය*<br>● නායකත්වය ලකුණු 02<br>● සන්නිවේදන හැකියාව ලකුණු 02<br>● පෞරුෂය ලකුණු 01 | 05 | |
| **එකතුව** | **100** | |

➢ වෘත්තීය පරීක්ෂණය

1. *නිශ්චල ඡායාරූප ශිල්පී තනතුර* :

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. කැමරාවක් ක්‍රියාකරවීම හා රූපගත කිරීම | 60 | |
| 2. ආලෝකය සැපයීම හා නවීන තාක්ෂණික ක්‍රම භාවිතය | 20 | |
| 3. පැහැදිලි ඡායාරූප ගැනීම | 20 | |
| එකතුව | 100 | 40% |

2. *වීඩියෝ කැමරා ක්‍රියාකරු* :

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|
| 1. වීඩියෝ කැමරා හා ඊට අදාළ උපකරණ | 30 | |
| 2. වෘත්තීය ආවරණයට සුදුසු පරිදි දර්ශන තෝරා ගැනීම හා දත්ත එක්රැස් කිරීම | 20 | |
| 3. රූපවාහිනී දර්ශනවලට අදාළව ස්වභාවික ආලෝකය උපයෝගී කර ගැනීම හා රූපගත කිරීම සඳහා විදුලි ආලෝකය යෙදීම | 20 | |
| 4. පරිගණක තාක්ෂණ භාවිතයෙන් ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳ හැකියාව | 10 | |
| 5. සංයුක්ත තැටි පටිගත කිරීමේ තාක්ෂණය හා ඊට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 10 | |
| 6. රූපවාහිනී මැදිරි තුළ රූගත කිරීම පිළිබඳ සාමාන්‍ය දැනුම | 10 | |
| එකතුව | 100 | 40% |

3. ශ්‍රව්‍ය/දෘශ්‍ය සංස්කරණ ශිල්පී :

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ශ්‍රව්‍ය/දෘශ්‍ය සංස්කරණ හා ඊට අදළ උපකරණ ක්‍රියාකරවීම | 40 | |
| 2. පරිගණක තාක්ෂණ භාවිතයෙන් සංස්කරණය පිළිබඳ හැකියාව | 40 | |
| 3. සංස්කරණය, මැදිරි තුළ සංස්කරණය කිරීම පිළිබඳ සාමාන්‍ය දැනුම | 20 | |
| එකතුව | 100 | 40% |

06. අයදුම්පත් පහත දැක්වෙන ආකෘති පත්‍රය අනුව A4 (8.27 x 11.69) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර **2021.12.31** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 08 වැනි මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුකූල නොවන හා අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.)

සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ,
සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,
08 වැනි මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ . . . . . . . . . . . . තනතුර සඳහා ඉල්ලුම් කිරීම**

01. මුලකුරු සමඟ නම :————.
02. සම්පූර්ණ නම :————.
03. උපන් දිනය :————.
04. වයස (2021.12.31 වැනි දිනට) : අවුරුදු :————. මාස :————. දින :————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
07. ලිපිනය :————.
08. දුරකතන අංකය :————.
09. අධ්‍යාපන සුදුසුකම් :————.

I. අ.පො.ස. (සා/පෙළ)

*වර්ෂය :* *විභාග අංකය :*

| *විෂයයන්* | *ලබාගත් සාමර්ථය* | *විෂයයන්* | *ලබාගත් සාමර්ථය* |
|---|---|---|---|
| 01. | | 06. | |
| 02. | | 07. | |
| 03. | | 08. | |
| 04. | | 09. | |
| 05. | | 10. | |

10. *වෘත්තීය සුදුසුකම් :*

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

11. *පළපුරුද්ද :*

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති සියලු තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, මෙහි සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට ප්‍රථම දැනගනු ලැබුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත් කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කළ හැකි බවත් මා දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

12-350

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර (දෙමළ මාධ්‍ය) සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - බදුල්ල දිස්ත්‍රික්කය

අංක 2243 හා 2021.08.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදනය කර තිබූ විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.15 වැනි දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර, එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

12-376

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - කෑගල්ල දිස්ත්‍රික්කය

අංක 2243 හා 2021.08.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදනය කර තිබූ විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරුවලට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.15 වැනි දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර, එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

12-375

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - කෑගල්ල දිස්ත්‍රික්කය

අංක 2243 හා 2021.08.27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදනය කර තිබූ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරට අදාළ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.15 දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය පමණක් සංශෝධනය විය යුතු අතර එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

12-374

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021 වර්ෂය

ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන යටතේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ මෙහි පහත I වැනි වගන්තියේ සඳහන් තනතුරු 148 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති රජයේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

මෙම නිවේදනයේ ''ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය'' යන්නෙන් අංක 1880/26 දරන හා 2014.09.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා මෙතෙක් එයට සිදුකර ඇති හා ඉදිරියට සිදු කරනු ලැබිය හැකි සියලු සංශෝධන අදහස් වේ. ''පත්කිරීම් බලධරයා'' යන්නෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද ''ලේකම්'' යන පදයෙන් ''කෘෂි-කර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්'' ද ''සේවය'' යන්නෙන් ''ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය'' ද ''පත්වීම්'' යන්නෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ තනතුරකට පත්වීමක් ද'' ලිඛිත විභාගය '' යන්නෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021 ද වෙනත් ආකාරයකින් විස්තර නොවේ නම් ''නිලධාරියා'' යන්නෙන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරියකු/නිලධාරිනියක ද අදහස් වේ. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2022.01.03 වේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2022 මාර්තු මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

*සටහන* : අංක 1929 දරන හා 2015.08.21 දිනැති රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන්නේ නම් නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. එසේ අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන්ගේ නාම ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ඇත. ඔවුන් නැවත අයදුම් කිරීමේ දී විභාග ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.

1. *තනතුරු හා පුරප්පාඩු සංඛ්‍යාව* :

| *ධාරාව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *තනතුරු කේතය* |
|---|---|---|---|
| කෘෂි සංවර්ධන | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) | 85 | 1 |
| කෘෂි පර්යේෂණ | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) | 59 | 2 |
| කෘෂි ආර්ථික විද්‍යා | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | 04 | 3 |

*සටහන*.-

සීමිත තරග විභාගයේ දී එක් අයදුම්කරුවකුට අයදුම්කළ හැකි වන්නේ ඉහත එක් ධාරාවක තනතුරකට පමණකි.

2. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

2.1 *ලිඛිත විභාගය* :-

ලිඛිත විභාගය පහත දැක්වෙන ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතවන අතර විෂය නිර්දේශය මෙම නිවේදනයේ පළමු පරිශිෂ්ටයේ දැක්වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය (පැය)* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 1 1/4 | 100 | 40 |
| විෂයානුබද්ධ අධ්‍යයනය (අදළ තනතුරට අනුව) | 2 | 100 | 40 |

2.2 ලිඛිත විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය.

2.3 *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* : ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ජ්‍යෙෂ්ඨතාවට ලකුණු ලබාදීම සඳහා සිදු කෙරේ. විභාගයේ එක් එක් විෂයයන් සඳහා ලකුණු 40%ක් ලබා සමත්වන අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන අයදුම්කරුවන් ප්‍රමාණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

2.3.1 සම්මුඛ පරීක්ෂණයේ දී ජ්‍යෙෂ්ඨතාව සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය .-අයදුම්කරුවකු නියමිත සුදුසුකම් සපුරාලන දිනයේ සිට අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය දක්වා සම්පූර්ණ කර ඇති සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට පමණක් ජ්‍යෙෂ්ඨතාව යටතේ ලකුණු ලබා දීම සඳහා ගණන් ගනු ලැබේ.

ලකුණු 30ක උපරිමයකට යටත්ව එම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට එක් වසරකට ලකුණු 02ක් බැගින්ද, දින 180ක් හෝ ඊට වැඩි සේවා කාලයක් වෙනුවෙන් ලකුණු 01 බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.

2.4 සම්මුඛ පරීක්ෂණයේ දී ජ්‍යෙෂ්ඨතාව වෙනුවෙන් අයදුම්කරුවන් ලබා ගත් ලකුණු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් පසු එම ලකුණු සහ ලිඛිත විභාගයේ ලකුණු එකතු කිරීමෙන් එක් එක් තනතුරක් සඳහා වන සීමිත තරග විභාගයේ අවසාන කුසලතා ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලබා දෙනු ඇත. එම ප්‍රමුඛතා ලේඛනයේ කුසලතා අනුපිළිවෙල මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අදළ තනතුරුවලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

3. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා කොන්දේසි* :-

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. 2016.01.01 දින හෝ එදිනට පසු රාජ්‍ය සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන්, ඔවුන්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු වේ.

3.2 තව ද, නිලධාරියකු නම් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට ද නිලධාරිනියක නම් වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට ද දායක විය යුතු ය. රජය මගින් විටින්විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

3.3 පත්වීම්ලාභීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

3.4 ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් සේවයේ අවශ්‍යතාව අනුව පළාත් රාජ්‍ය සේවයේ ද සේවය කිරීමට යටත් ය. මේ සඳහා නිලධාරියකු පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය කිරීමට තාවකාලිකව මුදා හරිනු ලැබිය හැකිය. නිලධාරියකු පළාත් රාජ්‍ය සේවයේ සේවය කළ යුතු කාලය තීරණය කරනු ලබන්නේ සේවා අවශ්‍යතාව අනුව පත් කිරීමේ බලධරයා සහ අදළ පළාත් බලධරයා අතර ඇති කර ගනු ලබන එකඟතාවය අනුවය.

(අ) සේවයෙන් මුදා හැරීමේ කොන්දේසිවලට යටත්ව පළාත් රාජ්‍ය සේවයේ තනතුරට පත්වීම් ලිපියක් පළාත් බලධරයා විසින් අදළ නිලධාරියා වෙත නිකුත් කරනු ඇත. නිලධාරියා අදාළ පළාත් බලධරයා විසින් පළාත තුළ ස්ථාන මාරු කිරීම් කරනු ලැබීමට යටත්වනු ඇත.

(ආ) පළාත් රාජ්‍ය සේවයේ නිරත කාලය තුළදී වුවද නිලධාරියකු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලනයට සහ විනය පාලනයට යටත්වනු ඇත.

(ඇ) පළාත් රාජ්‍ය සේවය සඳහා මුදා හරින ලද කාලය අවසානයේ දී නිලධාරියා නිත්‍ය සේවයට ආපසු පැමිණිය යුතු ය.

3.5 ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට පත් කිරීමේ දී සීමිත තරග විභාගයෙන් බඳවා ගනු ලබන නිලධාරීන් අවුරුදු 01ක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ. සීමිත බඳවා ගැනීම තුළින් පත් කරනු ලබන නිලධාරීන් වසර 3ක කාලයක් ඇතුළත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු වේ.

3.6 *නිපුණතා සංවර්ධනය*.-සේවයට බඳවාගත් නිලධාරීන් සඳහා කෘෂිකාර්මික සංවර්ධනයට අදළ සමාජ, ආර්ථික, සංස්කෘතික හා රාජකාරී කරන පරිසරයේ ඇති ප්‍රවණතාවන් පිළිබඳ නිපුණතාවයක් ලබා ගැනීමට අවශ්‍ය පුහුණුවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් හෝ දෙපාර්තමේන්තුව හඳුනා ගන්නා වෙනත් ආයතනයක් විසින් (*උදා*.- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) මාසයක (01) පුහුණු පාඨමාලාවක් තුළින් ලබා දෙනු ඇත. පාඨමාලාව අවසානයේ කරනු ලබන ඇගයීමකින් පසු සහතිකයක් නිකුත් කරනු ලැබේ. සේවයේ ස්ථිර කිරීමට මෙම සහතිකය ලබාගත යුතු ය.

3.7 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු නියමයන් හා කොන්දේසිවලට ද ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා මුදල් රෙගුලාසිවලට ද අංක 1589/30 දරන සහ 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද (මින් මතුවට කාර්ය පටිපාටික රීති ලෙස හඳුන්වනු ලබන) ඉහත නියමයන්, කොන්දේසි, නියෝග, විධිවිධාන, රෙගුලාසි හා රීතිවලට දනටමත් කර ඇති හෝ මින්මතු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

3.8 පත්වීම්ලාභීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත කාලය තුළ අදළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

04. *මාසික වැටුප් පරිමාණය* :

මෙම තනතුරුවලට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව හිමි ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත සඳහන් පරිදි වේ.
SL-01-2016-රු. 47,615 - 1,335 x 10 - 1,630 x 8 - 2,170 x 17 - රු.110,895

බඳවා ගනු ලබන්නේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට ය.
III ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවර රු. 47,615 වේ.

05. *බඳවා ගැනීම සඳහාවන සුදුසුකම් :*

5.1 මූලික සුදුසුකම්

5.1.1 කෘෂි සංවර්ධන ධාරාව සඳහා

(අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ කෘෂිකර්ම උපදේශක තනතුරක් දරන නිලධාරියකු වීම;

හෝ

(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක තාක්ෂණ සේවයේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම උපදේශක තනතුරක් දරන නිලධාරියකු වීම;

හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා ඇති, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල කාර්යභාරයන්හි සෘජුවම නියැලී සිටින හෝ නියැලුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු යටතේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නිලධාරියෙකු වීම

හෝ

(ඇ) වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති උද්‍යාන සහකාර තනතුරක් දරන නිලධාරියකු වීම;

හෝ

(ඉ) වසර පහ (5) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යාවේ දී උපාධියක් සහිත කෘෂිකර්ම උපදේශක හෝ උද්‍යාන සහකාර තනතුරක් දරන නිලධාරියකු වීම;

5.1.2. කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා-

(අ) වසර පහ (5) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආර්ථික විද්‍යාඥ සහකාර තනතුරක් දරන නිලධාරියකු වීම;

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා ඇති, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල කාර්යභාරයන්හි සෘජුවම නියැලී සිටින හෝ නියැලුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු යටතේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ නිලධාරියකු වීම;

5.1.3 කෘෂි පර්යේෂණ ධාරාව සඳහා-

(අ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පන්තියේ පර්යේෂණ සහකාර, පස් සමීක්ෂක හා ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරක් දරන නිලධාරියකු වීම;

හෝ

(ආ) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පර්යේෂණ සහකාර, පස් සමීක්ෂක හෝ ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරක් දරන නිලධාරියකු වීම;

හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමන ලද කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් ලබා ඇති හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව හෝ සත්ව විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා ඇති, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල කාර්යභාර-යන්හි සෘජුවම නියැලී සිටින හෝ නියැලුණු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු යටතේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ නිලධාරියකු වීම;

හෝ

(ඈ) වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කෘෂිකර්ම විද්‍යා හෝ විද්‍යා උපාධියක් සහිත පර්යේෂණ සහකාර, පස් සමීක්ෂක හෝ ඉඩම් ඇගයීමේ නිලධාරි තනතුරක් දරන නිලධාරියකු වීම;

*සටහන :*

ශ්‍රේෂ්ඨාධිකරණ අයදුම්පත් අංක : 61/2006 හි තීරණයට අදාළව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය පිළිබඳ පෙර ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කරන ලද අංක 1619/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* පළ කරන ලද 2009.09.18 වැනි දිනට කෘෂි මෙහෙයුම්

නිලධාරී හෝ වැඩ සටහන් සහකාර (කෘෂිකර්ම) යන තනතුරක් දරන ලදුව, වසර පහ (05) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ කෘෂි මෙහෙයුම් නිලධාරී හෝ වැඩසටහන් සහකාර (කෘෂිකර්ම) යන තනතුරක් දරන නිලධාරියකු වීම ද සීමිත බඳවා ගැනීම සඳහා අයදුම් කිරීමට මූලික සුදුසුකමක් ලෙස සලකා බලනු ලබන අතර, එම නිලධාරීන්ටද සීමිත බඳවා ගැනීම සඳහා අයදුම් කළ හැකි වන්නේ කෘෂි සංවර්ධන හෝ කෘෂි ආර්ථික විද්‍යා හෝ කෘෂි පර්යේෂණ යන ධාරාවන් අතුරින් එක් ධාරාවක් යටතේ පමණකි.

5.2 කායික සුදුසුකම් :-
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා සෑම අයුරකින්ම ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

5.3 වෙනත් සුදුසුකම් :-

i. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
ii. සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
iii. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට පසුව අයදුම්කරුවකුට අතීතයට බලපැවැත්වෙන පරිදි ලබාදෙනු ලබන සහන හෝ උසස්වීම් විභාගයට පෙනී සිටීම සඳහා නියමිත සුදුසුකම් සපුරාලීමක් සේ සලකා බලනු නොලැබේ.
iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

06. විභාග ගාස්තු :-

6.1 විභාග ගාස්තුව රුපියල් 1,200 කි.

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුවන්ගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

07. අයදුම්පත පිළියෙල කිරීම හා විභාගයට අයදුම් කිරීම පිළිබඳ උපදෙස් :-

7.1 සීමිත තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් එක් අයදුම්පතක් පමණක් ඉදිරිපත් කළ යුතුය. මෙම නිවේදනයේ අග සඳහන් කර ඇති ආදර්ශ ආකෘති පත්‍රය උපයෝගි කරගෙන සීමිත තරග විභාගයට අයදුම් කරන අයදුම්කරුවන් තම අයදුම්පත සකසා ගත යුතුවේ. එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් අඟල් 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අයදුම්පතේ අංක 01 සිට 06 තෙක් කොටස් පළමු වැනි පිටුවටද ඉතිරිය 02 හා 03 පිටවලටද වන පරිද්දෙන් අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය.

7.2 ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් ද, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් ද, මකන දියර හා වෙනස් කළ අයදුම්පත් සහ සංකේත අංක හා අනෙකුත් තොරතුරු නැවත ලියා ඇති අයදුම්පත් ද දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කරනු ලබන අයදුම්පතේ ඡායා පිටපතක් අයදුම්කරු විසින් ලඟ තබා ගැනීම අනිවාර්ය බව දන්වන අතර," සම්මුඛ පරීක්ෂණයට කැඳවන විට අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතුය.

7.3 අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල මාධ්‍ය අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ මාධ්‍ය අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කිරීම අවශ්‍ය වේ. අයදුම්පත් 2022.01.03 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ''විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ, '' ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට බඳවා ගැනීම සඳහා වූ සීමිත තරග විභාගය - 2021'' යන්න සඳහන් කර තිබිය යුතු ය.

7.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ. සීමිත තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නම් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් මගින්ද, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවක නම් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ මගින් ද කෘෂිකර්ම අමාත්‍යාංශයේ නම් විෂය බාර අමාත්‍යාංශ ලේකම් මගින් ද එවිය යුතුය.

*සටහන* : මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අදාළ නොවන සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන සහ අවිධිමත් අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ නමට අයදුම්පත් නොඑවිය යුතුය. යම් අයදුම්පතක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කරන පැමිණිලි කිසිවක් සලකා බලනු නොලැබේ.

08. විභාගයට පෙනී සිටීම :-

8.1 අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. විභාග යට අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී තමාට හිමි විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. තමාට පෙනී සිටීමට හිමි විභාගයේ නියමිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සෑම අපේක්ෂකයකුගේම වගකීමකි. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළකර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

8.2 අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු/ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.3 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාව :-

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

10. විභාග ක්‍රමය :-

10.1 විභාග මාධ්‍යය :
විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10.2 අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂා මාධ්‍යයකින් පමණක් පිළිතුරු ලිවිය යුතුය.

11. තරග විභාග පටිපාටිය හා අදාළ විෂය නිර්දේශය :

සියලුම අයදුම්කරුවන් මෙහි පළමු පරිශිෂ්ටයේ දැක්වෙන විෂය නිර්දේශයට අනුකූලව 1 වන හා 2 වන ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සැපයිය යුතුය.

එක් එක් තනතුරට අදාළ විෂය නිර්දේශය පළමු පරිශිෂ්ටයේ දැක්වේ.

12. අයදුම්පතට සහතික කිසිවක් අමුණා නොඑවිය යුතුය. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අවස්ථාවේදී පමණක් ඔවුන් තම අයදුම්පතෙහි සඳහන් කර ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල මුල් ලිපිලේඛන ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.

13. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයකුට මෙම තරග විභාගයට මුහුණ දීම සඳහා සුදුසුකමක් නොමැති බව අනාවරණය වුවහොත්, විභාග යට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාග

යෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින්ම යටපත් කර ඇති බව හෝ පත්වීම් දිනට පසුව හෙළි වුවහොත් එය ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත.

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14. මෙහි විධිවිධාන සලසා නොමැති කිසියම් හෝ කරුණක් වේ නම් ඒ පිළිබඳ අවසන් තීරණය පත්වීම් බලධාරියා විසින් ගනු ඇත.

15. පවතින පුරප්පාඩු සියල්ල හෝ කොටසක් හෝ පිරවීම/නොපිරවීම පිළිබඳ අවසන් තීරණය ගනු ලබනුයේ පත්වීම් බලධාරියා විසින් ය.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයන්හි භාෂා පාඨ අතර යම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම් එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත් කේ. ජයසිංහ,
ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය.

2021 නොවැම්බර් මස 24 වැනි දින,
අංක 80/5, ගොවිජන මන්දිරය,
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2021
Limited Competitive Examination for Recruitment to the Grade III of the Sri Lanka Agricultural Service - 2021

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

| අයදුම් කරන තනතුර (*ගැසට්* නිවේදනයේ 1 සහ 5 වන ඡේද බලන්න) | |
|---|---|
| තනතුර | තනතුරු කේතය |
| | |

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
(*ගැසට්* නිවේදනයේ 10 ඡේදය බලන්න - අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) තනතුර සඳහා අයදුම්කරන්නේ නම් පිළිතුරු සැපයීමට තෝරා ගනු ලබන කොටස : පළමු පරිශිෂ්ටය අනුව (අ) නම් කොටුව තුළ ''1'' ද (ආ) නම් කොටුව තුළ ''2'' ද ලියන්න. මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDENA

(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDENA, H. M. S. K.)

(iii) සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

02. (i) ස්ථිර පදිංචි ලිපිනය : (විභාග ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කෙරේ)
(අ) සිංහලෙන්/දෙමළෙන් :————.

(ආ) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

(ii) රාජකාරි ලිපිනය : (රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියකු නම් ඔහුගේ රාජකාරි ලිපිනය ලිවිය යුතුය. ලිපිනයෙහි වෙනසක් වුණි නම් එය වහාම දැන්විය යුතුය)

(අ) සිංහලෙන්/දෙමළෙන් :————.

(ආ) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

03. ස්ත්‍රී/පුරුෂභාවය : (ඉදිරි කොටුවෙහි නියමිත අංකය යොදන්න)

පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. (i) උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

(ii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

07. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන වග : (නියමිත කොටුවේ කතිර ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

08. අධ්‍යාපන සුදුසුකම් :

8.1 උපාධි සුදුසුකම් :

| ලබා ඇති උපාධිය/උපාධි | ලබා ඇති උපාධිය/ උපාධි සිව් අවුරුදු උපාධියක්ද/ උපාධි ද යන වග/ | අධ්‍යයන වර්ෂය හා එම උපාධිය/උපාධි වලංගු වන දිනය (පැහැදිලිව දක්වන්න) | විශ්ව විද්‍යාලය/ විද්‍යාලය | විෂයයන් | සාමර්ථ්‍යය | භාෂා මාධ්‍යය |
|---|---|---|---|---|---|---|
| 1. | | | | | | |
| 2. | | | | | | |
| 3. | | | | | | |

09. මීට පෙර ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට බඳවා ගැනීමේ සීමිත තරග විභාගවලට පෙනී සිටියේ ද යන්න ? පෙනී සිටියේ නම් පෙනී සිටි වර්ෂය/වර්ෂයන් සඳහන් කරන්න.

10. සීමිත තරග විභාග අපේක්ෂකයින් නිවේදනයේ 5 වැනි ඡේදය යටතේ මෙම විභාගය සඳහා සුදුස්සෙකු වීම පිණිස ලබා ඇති සුදුසුකම් මෙහි පහත දක්වන්න.

| වර්තමාන තනතුර | සීමිත බඳවා ගැනීම යටතේ සුදුසුකම් ලබන තනතුර | |
|---|---|---|
| 1. පර්යේෂණ සහකාර<br>2. පස් සමීක්ෂක නිලධාරි<br>3. ඉඩම් ඇගයීමේ නිලධාරි<br>4. කෘෂිකර්ම උපදේශක<br>5. ආර්ථික විද්‍යාඥ සහකාර<br>6. උද්‍යාන සහකාර<br>7. ආශ්‍රිත නිලධාරි සේවා ගණය<br>(තනතුර සඳහන් කරන්න.) | 1. ස. කෘ. අ. (කෘෂි පර්යේෂණ)<br>2. ස. කෘ. අ. (කෘෂි සංවර්ධන)<br>3. ස. කෘ. අ. (කෘෂි ආර්ථික විද්‍යා) | ස. කෘ. අ. (කෘෂි සංවර්ධන)<br>ස. කෘ. අ. (කෘෂි පර්යේෂණ) හෝ<br>ස. කෘ. අ. (කෘෂි ආර්ථික විද්‍යා)<br>තනතුරු සඳහා අයදුම් කිරීමට<br>සුදුසුකම්<br>සම්පූර්ණ කරන දිනය (*ගැසට්*<br>නිවේදනයේ 5.1 හි සුදුසුකම්<br>සම්පූර්ණ කරන දිනය වේ. |
| | | |

11. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වරදකරුව ඇත් ද? ඔව්/නැත
ඔව් නම් විස්තර සපයන්න

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ එහි එක් දරයකින් මෙහි අලවන්න.
(ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය)

13. අයදුම්කරුගේ සහතිකය :-

මෙම අයදුම්පතේ, මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මාගේ අයදුම්පත ප්‍රතික්ෂේප වීමට යටත් බවත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව දැනගතහොත් මාගේ පත්වීම වහාම අවලංගු වන බවත්, අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී යම් ප්‍රමාදයක් සිදුව ඇත්නම් එහි වගකීම මා වෙත පැවරෙන බවත්, මම හොඳාකාරව දැන සිටිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි. තව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත මෙහි අලවා ඇති බවත් මා ඉදිරිපත් කර ඇත්තේ එක් අයදුම්පතක් පමණක් බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

14. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/අමාත්‍යාංශ ලේකම්ගේ සහතිකය :-

..............................මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/පළාත් සභාවේ/අමාත්‍යාංශයේ/ ..............................ක ලෙස සේවයේ නියුතු බවත්, ඔහුගේ ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, පූර්වාසන්න වසර 05 ක කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත්, මෙම තනතුරට අදාළ 5.1 ඡේදයේ සුදුසුකම් සියල්ල සපුරා ඇති බවත්, ඔහු/ඇය මෙම තනතුරට අයදුම් කිරීමට සෑම අතින්ම සුදුසුකම් සපුරන බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන ඇති/නැති බවත්. සහතික කරමි. ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. (අදාළ නොවන වචන කපා හරින්න.)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/අමාත්‍යාංශ
ලේකම්ගේ අත්සන.

නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

පළමු පරිශිෂ්ටය

සීමිත තරග විභාග රෙගුලාසි හා විෂය නිර්දේශය

1 වැනි ප්‍රශ්න පත්‍රය - බුද්ධි පරීක්ෂණය

භාෂාමය, ගණිතමය හා තර්කන හැකියාව මැන බැලීම සඳහා වන ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශ්න /කෙටි ප්‍රශ්න පත්‍රයකි. කාලය පැය 1 1/4 කි. මුළු ලකුණු සංඛ්‍යාව 100 කි.

2 වැනි ප්‍රශ්න පත්‍රය - විෂයානුබද්ධ අධ්‍යයනය

මෙය නියම කර ඇති විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම මැන බැලීම සඳහා පවත්වනු ලබන තනතුරට අදාළ ලිඛිත අභියෝගතා පරීක්ෂණයකි. එක් එක් අයදුම්කරුවකු විසින් තමන් අයදුම් කරනු ලබන තනතුරට හෝ තනතුරුවලට අදාළ වන පරිදි පහත සඳහන් ප්‍රශ්න පත්‍ර අතුරින් තෝරාගනු ලබන ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටීමට අවකාශ ඇත. මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත වේ. කාලය පැය 2ක් වන අතර, මුළු ලකුණු සංඛ්‍යාව 100ක් වේ.

*සටහන.*-පහත සඳහන් විෂය නිර්දේශය අනුව සීමිත විභාග යේ දී විෂයානුබද්ධ අධ්‍යයනය දැනුම ප්‍රශ්න පත්‍රය ක්ෂේත්‍රයේ පළපුරුද්දට වැඩි නැඹුරුවක් වන සේ සකස් කරනු ලැබේ. විභාග කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරන ආකාරයට විභාගය පවත්වනු ලැබේ.

එක් එක් තනතුරට අදාළ විෂය නිර්දේශය පහත දැක්වේ.

1. කෘෂි පර්යේෂණ ධාරාව සඳහා විෂය නිර්දේශය :

අයදුම්කරුවන්ගේ මනාපය පරිදි පහත (අ) සහ (ආ) අතරින් එක් කොටසක් සඳහා පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

**(අ) කොටස**

01. **කෘෂිකාර්මික උද්භිද විද්‍යාව :**
බෝගවල වර්ගීකරණ මූලධර්ම, බෝග වර්ධන හා කායික විද්‍යාත්මක මූලධර්ම

02. **ප්‍රවේණි විද්‍යාව හා ශාක අභිජනනය :**
මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති අනුක ප්‍රවේණිය, සෛල ප්‍රවේණි විද්‍යාව, ප්‍රමාණාත්මක ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය, පරාගනය සහ අභිජනන සංකල්ප, විසංයෝගීතාව, මහා සහ නුමුහුන් පේළි වරණය, බහුලව භාවිත වන අභිජනන ක්‍රම හා වර්තමාන නැඹුරුව.

03. **ශාක ව්‍යාධි විද්‍යාව :**
ව්‍යාධි ජනක ජීවී කාණ්ඩ, ආසාදන, ඒවාට පැළෑටි දක්වන සංවේදිතාව, ආසාදන ආකාර, මේවා පාලනයේ මූලධර්ම, ශාක ව්‍යාධි විද්‍යාවේ සහ රෝග පාලනය පිළිබඳව වර්තමාන නැඹුරුව, රෝග විනිශ්චය කිරීමේ තාක්ෂණික ක්‍රම, රෝග ලක්ෂණ විද්‍යාව, කොක්ගේ උපකල්පිතය, රෝග විනිශ්චයේ නව තාක්ෂණ ක්‍රම (ELISA) හා වර්තමාන නැඹුරුව.

04. **කීට විද්‍යාවේ මූලධර්ම :**
සත්ත්ව වර්ගීකරණයේ මූලධර්ම, කෘමීන් වර්ග විලාසයන්, ජීවන තොරතුරු සහ හානි, කෘමි හානිවල ආර්ථික වැදගත්කම, කෘමි ගහණ හා හානි තක්සේරු කිරීම.

05. **බීජ තාක්ෂණය :**
බීජ කායික විද්‍යාව, බීජයක ව්‍යුහය, සුප්තතාව, ප්‍රරෝහණය, ජීව්‍යතාව, බීජ පරීක්ෂණ සහ පාරිශුද්ධතාව සඳහා පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථා, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

06. **පටක විද්‍යාව :**
මූලධර්ම, පටක විද්‍යාවේ පහසුකම් හා අවශ්‍යතාව, මාධ්‍යන්, පටක විද්‍යා රෝපණ ක්‍රම භාවිත කරන අවස්ථා, ප්‍රාක්ප්ලාස්මීය රෝපණය, විකෘති බිහිවීම, කලල බේරා ගැනීම, නලස්ථ සංසේචනය, ජානයේ පරිණාමය, ප්‍රාක්සංරක්ෂණය.

07. **කෘෂිකාර්මික රසායන විද්‍යාව :**
ජීව රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ජීව රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, ආහාර රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ආහාර රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේ දී ප්‍රායෝගික භාවිතයන්

හෝ

(ආ) කොටස

01. **ශෂ්‍ය විද්‍යාව :**
කෘෂි දේශගුණික විද්‍යාව, පරිසර විද්‍යාව, භූමි සංවර්ධනය, භූමි සැකසීම, බෝග වර්ධනයේ හා කායික විද්‍යාවේ මූලධර්ම, බෝග වර්ධන මිනුම්, අස්වනු පරාමිති, පොහොර නිර්දේශ හා කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව හා පාලනය, ජල සම්පාදන ක්‍රමවල මූල ධර්ම, බෝග පාංශු හා ජල සම්බන්ධතාවයේ මූලධර්ම.

02. **බෝග විද්‍යාව :**

වී, උස් බිම් ධාන්‍ය, මාෂ බෝග, අල බෝග හා අනෙකුත් ක්ෂේත්‍ර බෝගවල කායික විද්‍යාව, වර්ධන ප්‍රචාරණ ක්‍රම, රෝපණ ක්‍රම, බෝග පාලනයේ භෞතික, රසායන හා ජීව විද්‍යාත්මක ක්‍රම, විද්‍යාත්මක තෘණ බිම් ඇති කිරීම හා ඒවා පාලනය, දුව නිෂ්පාදන හා පළතුරු නිෂ්පාදන මූලධර්ම.

03. **පාංශු විද්‍යාව :**
පස නිර්මාණය, පසක භෞතික හා රසායනික ගති ලක්ෂණ, බෝග වගාවට අදාළව පසෙහි ඇති ගැටළු, පසෙහි සාරවත් බව පාලනය, ජල පෝෂක පාලනය, පැළෑටි පෝෂණය, පැළෑටි වර්ගීකරණ මූලධර්ම.

04. **ප්‍රවේණි විද්‍යාව හා පැළෑටි අභිජනනය:**

මූලධර්ම, මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති, අනුක ප්‍රවේණි විද්‍යාව සෛල ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය

05. *පැළෑටි ව්‍යාධි විද්‍යාව :*

පැළෑටි ආසාදන, ආසාදනවලට පැළෑටිවල සංවේදිතාව, ජෛව පාලනය, රෝග පාලනයේ නූතන ප්‍රවණතා

06. *කීට විද්‍යා මූලධර්ම :*

(අ) ප්‍රශ්න පත්‍රයේ 04 උපඡේදය යටතේ දක්වා ඇති කොටස මීට අදාළ වේ.

07. ක්ෂේත්‍ර පර්යේෂණ මූලධර්ම හා මූලධර්ම (Statistical Principles) සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි වැදගත් සංඛ්‍යාලේඛන පිළිබඳ දැනුම.

08. *කීට විද්‍යාව :*

කෘෂිකර්මයේ දී ආර්ථික වශයෙන් වැදගත් කෘමීන්, ඔවුන්ගේ වර්ගීකරණය, බාහිර සහ අභ්‍යන්තර ගති ලක්ෂණ, විවිධ පද්ධතිවල නිර්මාණය හා ඒවායින් කෙරෙන කාර්යන්, පළිබෝධ පාලනය, පළිබෝධ හානිවල වැදගත්කම, පළිබෝධ හඳුනා ගැනීම, ඔවුන්ගේ හානිය හා පාලනය, ඒකාබද්ධ පළිබෝධ පාලනය.

09. *ක්ෂුද්‍ර ජෛව විද්‍යාව :*

ක්ෂුද්‍ර ජීවීන් හා කෘෂිකාර්මික පරිසරය, ජෛව තාක්ෂණය කෘෂිකර්මය සඳහා භාවිතය, පාංශු ජීවීන් හා කෘෂි කර්මාන්තයට ඔවුන්ගේ බලපෑම.

10. *ජීවමිතිය හා ව්‍යවහාරික යෙදවුම් සංඛ්‍යානය :*

සංඛ්‍යානය සම්බන්ධ මූලික දැනුම, කෘෂිකාර්මික පර්යේෂණ, සැලසුම් විශ්ලේෂණ, දත්ත ලබා ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

*සටහන* : සීමිත බඳවා ගැනීම් තුළින් සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) තනතුරුවලට අයදුම් කරනු ලබන සියලුම අපේක්ෂකයින් ඉහත (අ) හෝ (ආ) හි සඳහන් කොටස් 02 අතරින් කවර හෝ එක් කොටසකට පමණක් පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

## II. කෘෂි සංවර්ධන ධාරාව සඳහා විෂය නිර්දේශය

01. *සාමාන්‍ය කෘෂිකර්මය :*

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප, ඉඩම් සංවර්ධනය, භූමි සැකසීම හා ආම්පන්න, බෝග ස්ථාපනය හා ඒ සඳහා අවශ්‍ය කරන යන්ත්‍රසූත්‍ර, පස හා පසෙහි සාරවත් බව, තවාන් හා තවාන් පාලනය, රෝපණ ද්‍රව්‍ය, පළිබෝධ පාලනය, පැළෑටි සංරක්ෂණය, උපකරණ, බෝග වගා ක්‍රම, ජලසම්පාදන ක්‍රම, ඒකාබද්ධ ගොවිතැන, ආරක්ෂිත කෘෂිකර්මය, ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම, අස්වැන්න නෙළීම හා අස්වැන්න නෙළන උපකරණ, පසු අස්වනු හානි, ගොවිපළ නිෂ්පාදන සකස් කිරීම, විශේෂිත ප්‍රදේශවල වගා කිරීමට සුදුසු එළවළු වර්ග, පලතුරු, පියලි බෝග සහ ධාන්‍ය තෝරාගැනීමේ දී සැලකිය යුතු කරුණු, ඒකාබද්ධ පළිබෝධ පාලනය, ඒකාබද්ධ පැළෑටි පෝෂණ පද්ධති, ශාක ආරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත.

02. *බෝග නිෂ්පාදනය :*
ශෂ්‍ය විද්‍යාව, කෘෂි දේශගුණික කලාප සහ පරිසරය, භූමි සංවර්ධනය සහ බිම් සැකසීම, බෝගවල වැඩීමේ මූලධර්ම සහ පැළෑටි භෞතවේදය, බෝගවල වැඩීම මැනීම, අස්වනු සංරචක, පොහොර නිර්දේශ හා ඒවායේ කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව සහ පාලනය, ජලසම්පාදනය, ශෂ්‍ය විද්‍යාව, බෝග හා ජලය අතර සම්බන්ධතාවේ මූලධර්ම.

03. *ක්ෂේත්‍ර බෝග :*

හැඳින්වීම, පාරිසරික අවශ්‍යතාවන්, ශාක විශේෂ හා ප්‍රභේද පැළෑටි වර්ධනයේ භෞතවේදය, අස්වැන්න තීරණය කිරීමේ කායික විද්‍යාත්මක මූලධර්ම, වී බෝගයේ ශෂ්‍ය විද්‍යාව, බෝග පාලනය හා නිෂ්පාදනය, උස් බිම් ධාන්‍ය, රනිල, අල බෝග සහ වෙනත් වැදගත් ක්ෂේත්‍ර බෝග (දුම්කොළ, එළු, කෙඳි බෝග සහ තෙල් බෝග)

04. බෝග පාලනය :

අතුරු බෝග වගාව, අස්වැන්න නෙළීම හා සැකසීම

05. *උද්‍යාන බෝග නිෂ්පාදනය :*
පලතුරු නිෂ්පාදනය, පෝෂණ අගය, සමාජීය හා ආර්ථික සාධක, ආරම්භය හා ව්‍යාප්තිය, පාරිසරික අවශ්‍යතාවන්, වගා ක්‍රම, නව තාක්ෂණික ක්‍රම භාවිතය.

06. *පලතුරු, එළවළු හා මල් නිෂ්පාදනය :*

තවාන් පාලනය, උද්‍යාන පාලනය, බෝග ආශ්‍රිත නව තාක්ෂණ හා වගා ක්‍රම, පලතුරු හා එළවළු බෝග වැඩි දියුණු කිරීම, පලතුරු හා එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, පසු අස්වනු හානි, පලතුරු හා එළවළුවල පසු අස්වනු හානි වළකා ගැනීම, ජෛව තාක්ෂණය, පලතුරු හා එළවළුවලට දේශීය හා විදේශීය වෙළෙඳපොල, නූතන සීමාවන් හා අනාගත උපාය මාර්ග, එළවළු නිෂ්පාදනය සඳහා අවශ්‍යතාවන්, එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, අලෙවිය, මල් වගා කර්මාන්තය, ප්‍රචාරණ තාක්ෂණය, වගා ක්‍රම, ප්‍රශස්ත පරිමිති, භූමි අලංකරණ මූලධර්ම.

07. *කෘෂිකර්ම ව්‍යාප්තිය හා පුහුණුව :*

කෘෂිකර්ම ව්‍යාප්තිය අර්ථ දැක්වීම හා පරමාර්ථ, කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකර්ම ව්‍යාප්තිය, අනුවර්තනය හා නව්‍යතා විසරණය, සන්නිවේදනය, ව්‍යාප්ති ඉගැන්වීමේ ක්‍රම, ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන ව්‍යාප්ති ප්‍රවේශ, පර්යේෂණ ව්‍යාප්ති සම්බන්ධතාව, ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම, සමාලෝචන ඇගයීම, ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාප්තිය හා සම්බන්ධ වූ ආයතන, වැඩිහිටි අධ්‍යාපනය, පුහුණු කිරීමේ ක්‍රියාවලිය, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට භාවිත කෙරෙන විවිධ ක්‍රම, පාඩම් සැලසුම් සැකසීම, පුහුණුව ඇගයීම, පුහුණුව සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය.

08. *බීජ තාක්ෂණය :*

බීජ කායික විද්‍යාව, බීජ ව්‍යුහය, බීජ රූප විද්‍යාව, බීජ ප්‍රරෝහණය, බීජ ප්‍රරෝහණ ශක්තිය, බීජ පරීක්ෂා කිරීම, බීජ ප්‍රරෝහණ ශක්තිය හා පාරිශුද්ධතාව පිළිබඳ පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථාවන්, බීජ සහතික කිරීම. බීජ ගබඩා කිරීම.

09. *මී මැසි පාලනය :*

මී මැසි ගණාවාසයක මී මැසි වර්ග හා වද වර්ග , මී මැසි පෙට්ටිවල කොටස්, මී මැසි ගණාවාස අල්ලා ගැනීම, තැන්පත් කිරීම, කට්ටි බෙදීම, මී මැසි ගණාවාසයක රෝග හා පළිබෝධ.

III කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා විෂය නිර්දේශය

01. *කෘෂිකාර්මික නිෂ්පාදන ආර්ථික විද්‍යාව හා ගොවිපළ පාලනය :*

කෘෂිකාර්මික නිෂ්පාදනයේ දී ගොවිපළ පාලනයේ ඇති වැදගත්කම, මූලික සංකල්ප, නිෂ්පාදන ශ්‍රිතය, නිෂ්පාදන ශ්‍රිතයන්හි ස්වරූප, නිෂ්පාදන ශ්‍රිතයේ හැඩය, නිෂ්පාදන උපේක්ෂා වක්‍රත්වරණය, සම ආදායම් රේඛාව, උපයන සම්පත් සම්බන්ධතාව හා පිරිවැය අවම ප්‍රමාණයට අවදානම පිළිබඳ මූල ධර්ම, හීනවන ඵලදා න්‍යාය, ආදේශය හා ආදායම් ප්‍රතිචාපක, කෘෂිකර්මයේ ඇති අවදානම හා අඩමානයට මුහුණ දීම සඳහා නිෂ්පාදන සකස් කිරීමේ නැම්යාව හා විවිධාංගීකරණය, කෘෂිකාර්මික මිල නියම කිරීමට අදාළ වන පරිදි මිල න්‍යාය, බෝග සහ සත්ත්ව සංයෝග අගය කිරීම, ගොවිපළ ප්‍රමාණය හා පරිමාණකුල ඵල, පවුල් ගොවිපළ වැදගත්කම හා සාපේක්ෂ වාසිය පිළිබඳ මූලධර්ම, ගොවිපළ යාන්ත්‍රිකරණයේ ශක්තිමත් හා දුර්වල කරුණු නිර්ණය කිරීමේ දී වාර්තාවල ඇති වැදගත්කම හා උපරිම කරන ආකෘති සඳහා මෙම තොරතුරු ඇතුළත් කිරීම.

02. *කෘෂිකාර්මික අලෙවිය :*

අලෙවි කිරීමේ මූලධර්ම, නිෂ්පාදනයේ හා අලෙවියේ සාපේක්ෂ වැදගත්කම, ශ්‍රී ලංකාවේ අලෙවිය පිළිබඳ කටයුතු කරන ආයතන, අලෙවි මාර්ග වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහි ලා එවැනි ආයතනයක කාර්යභාරය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේ දී මුහුණ පෑමට සිදුවන ගැටලු හා අලෙවි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අදාළ මූල ධර්ම.

03. *ඉඩම් ආර්ථික විද්‍යාව :*

ආර්ථික විද්‍යාත්මක සංකල්ප ඉඩම් පරිශීලනයට බලපාන අයුරු, ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ඉල්ලුම හා සැපයුම, ඉඩම් පරිශීලන කටයුතු ශ්‍රී ලංකාවේ සැලසුම් කරන අයුරු, ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීමේ හා මිනිසුන් පදිංචි කරවීමේ වැඩ සටහනේ වැදගත්කම.

12-191

---

## විදේශ කටයුතු අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරින් සඳහා වූ පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ විදේශ භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2020/2021

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරින් සඳහා වූ පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා විදේශ භාෂාව පිළිබඳ පරීක්ෂණය 2022 මාර්තු මස කොළඹ දී සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයන් හි දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකට ම එකවර ඉදිරිපත්වීමට හැකිවන පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශය :*

පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග පාලනය කරන විෂය නිර්දේශපත්‍ර හා අනෙකුත් විධිවිධාන ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාවෙහි අන්තර්ගත වී ඇත.

පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම්වලට හා විදේශ භාෂාවලට අදාළ විෂය නිර්දේශ හා විධිවිධාන පරිශිෂ්ටය 'අ' හි ද දක්වා ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් සඳහා එකම වාරයකදී හෝ වෙන් වෙන් වශයෙන් වාරකිහිපයකදී, ඔවුන්ගේ කැමැත්ත අනුව පෙනී සිටීමට නිලධාරීන්ට අවසර තිබේ.

04. කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේ ය.

**පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

| *විෂය අංකය* | *විෂයය* | *කාලය පැය* |
|---|---|---|
| I කොටස | | |
| 01 | මුදල් | 03 |
| 02 | ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය | 03 |
| II කොටස | | |
| 03 | මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 |
| 04 | රාජ්‍යතාන්ත්‍රික පරිචය | 03 |
| 05 | ජාත්‍යන්තර කටයුතු | 03 |
| 06 | ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව, විදේශ සේවා අමාත්‍යාංශ රෙගුලාසි හා පරිගණක හැකියාව | 03 |

**දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

| I වැනි කොටස | | |
|---|---|---|
| විෂයය අංකය | විෂයය | කාලය පැය |
| 21 | ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය | 03 |
| 22 | පරිපාලනය (අ) කාර්යාල ක්‍රම හා සංවිධාන ක්‍රම (ආ) ආයතන සංග්‍රහය (I සහ II වෙළුම) | 03 |
| II වැනි කොටස | | |
| 23 | මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය | 03 |
| 24 | රාජ්‍යතාන්ත්‍රික පරිචය | 03 |
| 25 | ජාත්‍යන්තර කටයුතු | 03 |

**විදේශ භාෂා**

| විෂයය අංකය | විෂයය | කාලය පැය |
|---|---|---|
| 07 | අරාබි | 02 |
| 08 | ප්‍රංශ | 02 |
| 09 | රුසියානු | 02 |
| 10 | ස්පාඤ්ඤ | 02 |
| 11 | හින්දි | 02 |
| 12 | චීන | 02 |
| 13 | ජර්මන් | 02 |
| 14 | ජපන් | 02 |
| 15 | ඉතාලි | 02 |
| 16 | කොරියානු | 02 |

05. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි යොමු කරවනු ලැබේ.

"දෙපාර්තමේන්තුගත විභාග (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළු) -උසස් කිරීමේ විභාගවලට මෙන්ම කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට ද මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුළත්වීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවය. තරග විභාගයක් නොමැතිව මුලින් ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට සුදුසුකම් ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාව ය."

05.1 ප්‍රතිඵල නිකුත් කිරීම :

විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු සංඛ්‍යාවක් ලබාගත යුතුය. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ලේඛනය, පළමු කාර්යක්ෂමතා කඩඉම හා දෙවන කාර්යක්ෂමතා කඩඉම ලෙස වෙන් වෙන් වශයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත පමණක් ලබාදෙනු ඇත.

06. විදේශ භාෂා හැර අනෙකුත් ප්‍රශ්න පත්‍රවලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් පිළිතුරු සැපයීමට අපේක්ෂකයින්ට හැකි වනු පිණිස විභාග කොමසාරිස් ජනරාල් කටයුතු කරනු ඇත. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

07. අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. අයදුම්පත්‍ර, ආදර්ශ ආකෘතියට අනුව, A 4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. A 4 දෙපසම පාවිච්චි කළ යුතු අතර, අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 1 සිට 8 දක්වා පළමු පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද ඇතුළත්වන සේ අයදුම්පත සකස් කළ යුතුය. අයදුම්පත අපේක්ෂකයාගේ අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අයදුම්පත්‍රය පිළියෙළ කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. විභාග දෙකටම පෙනී සිටින අයදුම්කරුවන් ඒ ඒ විභාගය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන බැවින් ඔබ විසින් ඉදිරිපත් කරන අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත්‍රය යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම් පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා තිබේ ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන්න.

08.1 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :-

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස්

ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. සියලුම අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් 2021.12.31 වැනි දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්ට යැවීමට හැකිවන පරිදි, විදේශ කටයුතු අමාත්‍යාංශයේ, විදේශ දූත මණ්ඩල පාලන අංශයට එවිය යුතුය. විදේශ දූත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් දූත මණ්ඩල ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කරන ලද සියලුම අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙකු වේ නම්, තම ඉල්ලුම් පත්‍රයේ හා (විභාග ගාස්තු ගෙවීම අදාළ නම්) ඊට අදාළ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද සහිතව ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කොට අදාළ ඉල්ලීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කිරීම වඩාත් ඵලදායී වනු ඇත.

11.1 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11.2 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් විසින් පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීම සඳහා අවසර දෙනු නොලැබේ.

13. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14. පළමුවැනි වතාවට මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් විභාග ගාස්තුවලින් නිදහස් වන අතර, ඉන්පසුව පෙනී සිටින අවස්ථාවල දී පහත පරිදි විභාග ගාස්තු ගෙවිය යුතුය.

(*අ*) පළමුවැනි වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක්) සඳහා ගාස්තු අය නොකෙරේ.

(*ආ*) ඉන්පසු එක් එක් වතාව සඳහා

| | *රු. ශත* |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා | 1200 0 |
| එක් විෂයයකට | 600 0 |

විභාග ගාස්තු, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයකට හෝ විදේශ දූත මණ්ඩලයකට ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවීමට කටයුතු කරන්න. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කිසිදු හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ. එසේම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

15. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ. විභාගය සම්බන්ධ අවසන් තීරණය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලත්වයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ,
විදේශ කටයුතු ලේකම්.

විදේශ කටයුතු අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ-01.

**ආදර්ශ අයදුම්පත**

විදේශ කටයුතු අමාත්‍යාංශය

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් සඳහා වූ පළමු හා දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ විදේශ භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2020/2021**

1st and 2nd Efficiency Bar Examinations and Foreign Language Test for the Officers of the Sri Lanka Foreign Service - 2020/2021

අයදුම්කරු විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐
(අදළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

සිංහල 2
දෙමළ 3
ඉංග්‍රීසි 4

01. ඉල්ලුම් කරන විභාගය ☐
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)

| විභාගය | අදළ අංකය |
|---|---|
| කාර්යක්ෂමතා කඩඉම 1 | 1 |
| කාර්යක්ෂමතා කඩඉම 2 | 2 |
| විදේශ භාෂාව | 3 |

02. (අ) (i) සම්පූර්ණ නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ii) සම්පූර්ණ නම :
(සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

04. උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

06. ජංගම දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

07. ස්ත්‍රී/පුරුෂ භාවය :
(අදාළ අංකය කොටුව තුළ සඳහන් කරන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1

08. ශ්‍රී ලංකා විදේශ සේවයට පත් වූ දිනය:

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

09. වර්තමාන තනතුර :————.

10. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති අන්දමට ඉල්ලුම් කරන විභාගයට අදාළ විෂයය අංක පැහැදිලිව සඳහන් කළ යුතුය. (අයදුම්පතේ සඳහන් කර ඇති විෂයයන් හැර වෙනත් විෂයයන්වලට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.)

| විෂයය | විෂය අංකය |
|---|---|
| i. | |
| ii. | |
| iii. | |
| iv. | |
| v. | |
| vi. | |

11. අයදුම්කරු මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විභාග අංකය, විෂයය, වර්ෂය හා මාසය ද සඳහන් කරන්න :————.

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

විභාග ගාස්තු ගෙවන ලද අංක .................... දරන කුවිතාන්සිය මෙයට අමුණා ඇත.
ගෙවන ලද විභාග ගාස්තුව රු.......................................

————, ————,
දිනය අපේක්ෂකයාගේ අත්සන.

විභාග ගාස්තු :
(i) ගෙවන ලද තැපැල් / උප තැපැල් කාර්යාලය / විදේශ දූත මණ්ඩලය :————.
(ii) ගෙවූ මුදල :————.
(iii) ගෙවූ දිනය :————.

(iv) ලදුපත් අංකය :————.

| |
|---|
| මුදල් කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුය. (කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |

12. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

විභාග කොමසාරිස් ජනරාල්,

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, .................................... මයා/ මිය /මෙනෙවිය, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සනත්, අයදුම්කරු නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර :..............

දිනය :..........................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

පරිශිෂ්ටය "අ "

**01. පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

1.1 පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විත වන අතර, අයදුම්කරුවන්ට කොටස් දෙකට එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැක.

1.2 මතු සඳහන් විෂයය යටතේ විභාගය පවත්වනු ලැබේ.

I වැනි කොටස

(i) මුදල් - පහත කරුණු ආවරණය වන සේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත.

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර)

(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තුව උදා: ඒවා සකස් කිරීම, ශීර්ෂ, මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්.

(ඇ) කච්චේරි මගින් විශේෂයෙන් කර ගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥාපනත්

(ii) ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ භූගෝලය

II වැනි කොටස- විශේෂ ප්‍රශ්න පත්‍ර:

(i) මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය.

(ii) රාජ්‍යතාන්ත්‍රික පරිචය.

(iii) ජාත්‍යන්තර කටයුතු.

(iv) ශ්‍රී ලංකා විදේශ සේවා ව්‍යවස්ථාව, විදේශ සේවා අමාත්‍යාංශ රෙගුලාසි සහ පරිගණක හැකියාව.

1.3 ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක කාල සීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

1.4 නිලධාරියෙකුට ඕනෑම වාර ගණනක දී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටිය හැකි අතර එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබාගත් පසු ඔහු/ඇය එම ප්‍රශ්න පත්‍රය සමත්වූවකු ලෙස සලකනු ලැබේ.

**02. දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

2.1 දෙවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොටස් දෙකකින් සමන්විත වන අතර, අයදුම්කරුවන්ට කොටස් දෙකට එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැක.

2.2 මතු සඳහන් විෂය යටතේ විභාගය පවත්වනු ලැබේ.

I වැනි කොටස

(i) ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය,

(ii) පරිපාලනය - පහත කරුණු ආවරණය වන සේ මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරෙනු ඇත.

(අ) කාර්යාල ක්‍රම සහ සංවිධාන ක්‍රම,

(ආ) ආයතන සංග්‍රහය I වෙළුම සහ II වෙළුම.

II වැනි කොටස- විශේෂ ප්‍රශ්න පත්‍ර:

(i) මූලික ආණ්ඩුක්‍රම නීතිය සහ ජාත්‍යන්තර නීතිය.

(ii) රාජ්‍යතාන්ත්‍රික පරිචය.

(iii) ජාත්‍යන්තර කටයුතු.

2.3 ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රය පැය තුනක කාල සීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

2.4 නිලධාරියෙකුට ඕනෑම වාර ගණනක දී එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන වෙනම පෙනී සිටිය හැකි අතර, එක් එක් ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් සුදුසුකම් ලැබීමේ ලකුණු ලබාගත් පසු ඔහු/ඇය එම ප්‍රශ්න පත්‍රය සමත් වූවකු ලෙස සලකනු ලැබේ.

*සටහන* :

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යටතේ ප්‍රධාන වශයෙන් ප්‍රශ්න නියම කරනු ලබන්නේ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව, පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ විකාශය අළලාය.

(ii) ද්විපාර්ශ්වික මෙන්ම බහුපාර්ශ්වික දෙගණයේම අන්තර් රාජ්‍ය සම්බන්ධතා එකිනෙකට අදාළව රාජ්‍යතාන්ත්‍රික නීතිය සහ ගිවිසුම් නීතිය යන ක්ෂේත්‍රය අළලා ජාත්‍යන්තර නීතිය යටතේ ප්‍රශ්න නියම කරනු ලැබේ.

(iii) නීතිඥවරයෙකු වන්නා වූ හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීති උපාධියක් ලබා ඇත්තා වූ හෝ නිලධාරියකු විභාග යට අදාළ විෂයයවලින් සාමාර්ථ්‍ය ලබා ඇත්නම්, ඔහු/ඇය මූලික ආණ්ඩුක්‍රම නීතිය හා ජාත්‍යන්තර නීතිය යන ප්‍රශ්න පත්‍රයෙන් නිදහස් කරනු ලබනවා ඇත.

**03. විදේශ භාෂා :**

3.1. විදේශ භාෂා

| | | | |
|---|---|---|---|
| (i) | අරාබි | (vi) | චීන |
| (ii) | ප්‍රංශ | (vii) | ජර්මන් |
| (iii) | රුසියානු | (viii) | ජපන් |
| (iv) | ස්පාඤ්ඤ | (ix) | ඉතාලි |
| (v) | හින්දි | (x) | කොරියානු |

3.2 ඉහත එක් එක් ලිඛිත ප්‍රශ්න පත්‍රය පැය දෙකක කාලසීමාවක් සඳහා වන අතර, සාමාර්ථය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය යටතේ 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021

1.0 සමුපකාර සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2022 මාර්තු මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ ''Our Services'' යටතේ ඇති ''Online Applications - Recruitment Exams'' ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර අදාළ නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ. වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''සමුපකාර සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2021'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2021 දෙසැම්බර් මස 31 වැනි දින වේ.**

*සටහන* : අයදුම්පතේ මුද්‍රිත පිටපත තැපැල් මගින් එවීම අනිවාර්ය වන අතර, එය තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතුය.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

3.0 මෙහිදී පිරවීමට අපේක්ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 21 කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 මෙම විභාගය මගින් පුරවනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයින් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන ආබාධ සහිත පුද්ගලයින් අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3%ක ප්‍රතිශතයක් පමණක් පත්වීම් ලබාදීම සඳහා තෝරා ගැනෙනු ඇත. තෝරා ගනු ලබන අපේක්ෂකයින්ගේ ලකුණු මට්ටම යටත් පිරිසෙයින් 50% ක් වත් විය යුතුය. පත්වීමක් සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයකු විශේෂඥ වෛද්‍ය පරීක්ෂණ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කරන අතර, විශේෂඥ වෛද්‍ය වාර්තාවකින් තම ආබාධ සහිත තත්ත්වය හා එය අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා බාධාවක් නොවන බව තහවුරු කළ යුතුය.

5.0 *වැටුප.*-2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 (MN - 03-2016) අනුව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය

රු. 31,040-10x445-11x660-10x730-10x750-රු. 57,550ක් වේ.

6.0 මෙම තනතුර ස්ථිරය. මෙම විභාගයෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට පත්වන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට එම නිලධාරීන් යටත් වේ.

7.0 ***සුදුසුකම්*** - සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් අදාළ වේ.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(*ආ*) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 2003.12.31 දිනට හෝ ඊට පෙර හා 1976.12.31 දිනට හා ඊට පසුව උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

*සටහන* :

රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරුවල සේවයේ නියුතු නිලධාරින් මෙම විභාගය මගින් බඳවා ගැනීමේදී මෙම අවස්ථාවේ පමණක් උපරිම වයස් සීමාව අවුරුදු 45ක් ලෙස සලකනු ලැබේ. එබැවින් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු 2003.12.31 දිනට හෝ ඊට පෙර හා 1976.12.31 දිනට හෝ ඊට පසුව උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.

(*ඇ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(*ඈ*) සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් සිටිය යුතු ය.

(ඉ) *අධ්‍යාපන සුදුසුකම්* :

(1) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(2) ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, ව්‍යාපාර සංඛ්‍යානය, ව්‍යාපාර අධ්‍යයනය, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එක් විෂයයක් හෝ ඇතුළුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණ හැර) එක්වර සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

(3) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ගණකාධිකරණ හෝ විගණන හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සමත්ව තිබීම,

හෝ

ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත්ව තිබීම හෝ ඒ හා සමාන සුදුසුකම් ලබා තිබීම,

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය හෝ කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්ව තිබීම.

*සටහන* :

(1) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

8.0 *විභාග පරිපාටිය හා විෂය නිර්දේශය* :

8.1 විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

8.2 විභාගය විෂයය සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු පහත දැක්වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| (1) බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40 |
| (2) සාමාන්‍ය දැනීම | පැය 1 | 100 | 40 |

8.3 (1) *බුද්ධි පරීක්ෂණය* :

අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූලභාවයන් ද විශ්ලේෂණ හැකියාවන් ද තීරණ ගැනීමේ ශක්තීන් ද විනිශ්චය කිරීම සඳහාවූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(2) *සාමාන්‍ය දැනීම* :

(*අ*) ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික හා දේශපාලන දැනුම ; සහ

(*ආ*) ජාතික හා ජාත්‍යන්තර සමුපකාර දර්ශනය හා ව්‍යාපාරය පිළිබඳ දැනුම විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින්, සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*සටහන* :

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක්වත් අපේක්ෂකයා විසින් ලබාගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරුපතක් සම්බන්ධයෙන් අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

8.4 පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත් වන සේ විභාගය සමත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත ලබාදෙනු ඇත. එයට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අපේක්ෂකයන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

*සම්මුඛ පරීක්ෂණය* :

ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් ප්‍රමාණවත් බවට සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තාවූ අපේක්ෂකයින් සම්බන්ධයෙන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් තීරණය කරනු ඇත.

9.0 *ව්‍යාජ තොරතුරු හා දඬුවම්* :

අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින්

ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10.0 ***විභාග ගාස්තු*** :

(අ) විභාග ගාස්තුව රු. 600 කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card )
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with internet transaction facilities)
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය (Bank of Ceylon Online Banking Method)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon Slip Payments)
v. තැපැල් දෙපාර්තමේන්තුවේ ඕනෑම තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at any Post Office)

*සටහන*.- ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු/වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලැබේ.

11.0 ***අයදුම් කිරීම සහ අයදුම්පත් එවිය යුතු පිළිවෙළ*** :

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදුකරනු ලබන අතර, වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කරගන්න.

අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න.

අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව, එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කරනු ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් යොමු කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාග යට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් එම විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13.0 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021'' යන්න සඳහන් කරන්න.

14.0 අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිව්රුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

15.0 සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2021 දෙසැම්බර් මස 31** වැනි දින හෝ ඊට පෙර හෝ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
ආයතනික විභාග සංවිධාන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ.

16.0 ***විභාගයට පෙනී සිටීම*** - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමෙහි සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

16.1 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

17.0 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

18.0 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට/ඇයට සිදුවනු ඇත.

19.0 මෙහි සඳහන් නොවන යම්කිසි කරුණක් වෙතොත් ඒ සම්බන්ධව සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

20.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

ගමානි එන්. ලියනාරච්චි,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (වැ. බ.)

2021 නොවැම්බර් මස 23 වැනි දින.

**Department of Examinations, Sri Lanka**

OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO COOPERATIVE DEVELOPMENT OFFICER - III OF THE DEPARTMENT OF COOPERATIVE DEVELOPMENT - 2021

(1) Medium applied for the examination

(I) The medium applied for the exam (Candidates should appear for the examination only through the medium mentioned here)

(2 ) Personal Information

(I) Name in Full (in English Block Capitals)
(II) Name with initials at the end (In English Block Capitals)
(III) Postal Town of the Current Address (In English Block Capitals)
(IV) National Identity Card Number
(VI) Telephone Number (Mobile)
(VII) Telephone Number (Fixed)
(VIII) Gender
(IX) Date of Birth
(X) Age as at closing date of the application
(XI) Marital Status

(3) Educational Qualifications - G. C. E. (Ordinary Level) Examination

Should pass minimum of 06 subjects at G. C. E. (Ordinary Level) Examination with at least 05 credits in one & same sitting. It is compulsory to process credit passes for Sinhala/ Tamil Language, English and a Distinction Pass for Mathematics.

Year :————. Index Number :————.

| | | | |
|---|---|---|---|
| 1 | ————. | Grade | ————. |
| 2 | ————. | Grade | ————. |
| 3 | ————. | Grade | ————. |
| 4 | ————. | Grade | ————. |
| 5 | ————. | Grade | ————. |
| 6 | ————. | Grade | ————. |
| 7 | ————. | Grade | ————. |
| 8 | ————. | Grade | ————. |
| 9 | ————. | Grade | ————. |
| 10 | ————. | Grade | ————. |

(4) Educational Qualifications - G. C. E. (Advanced Level) Examination

03 Simple passes at G. C. E. (Advanced Level) Examination in one & same sitting (Excluding General English)

Year :————. Index Number :————.

| | | | |
|---|---|---|---|
| 1 | ————. | Grade | ————. |
| 2 | ————. | Grade | ————. |
| 3 | ————. | Grade | ————. |
| 4 | ————. | Grade | ————. |

(5) IT Literacy & Other Qualifications

Qualification Obtained :————.
Institute awarded :————.
Effective date of the certificate :————.
main subject/ subjects followed :————.

(6) Non - Related Referees

| | | |
|---|---|---|
| (i) | Name | |
| | Address | |
| | Contact No. | |
| (ii) | Name | |
| | Address | |
| | Contact No. | |

(7) ***Declaration of the Applicant***

I, do hereby declare that the particulars furnished here are true according to my knowledge and belief. I am aware that I will be dismissed from the service if it is revealed that I am not eligible to be appointed to this post after being selected to the post. Any information mentioned herein not will be altered later. Further I declare that I will be subject to the rules & regulations imposed by the Commissioner General of Examinations Pertaining to the conduct of the Examination and the issuance results.

Signature of the applicant :————.
Date :————.

(8) ***Attestation of signature of The applicant***

I Certify that Mr/Mrs/Miss.......................................... Submitting this application is personally known to me and he/she placed his/her signature before me on .................... ................

Signature of the officer attesting the signature :————.
Date :————.
Full name of the attesting officer :————.
Post and Address (Confirm with the seal) :————.

***(9) Recommendation of the Head of Department. (Only for the applicants in Public Service)***

I hereby Certify that Mr./Mrs./Miss. ............................. ............ who is submitting this application is serving in a permanent and pensionable post in this department, he/she has satisfied the relevant qualifications for applying for this post as per this *Gazette* Notification and that he/she could be released from his/her present post, if selected for the position.

————,
Signature of the Head
of the Department

Date :————.

Name of the Head of the Department :————.
Designation :————.
Address :————. (Place the Official Stamp)

12 - 351

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

### 2021 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **දෙසැම්බර්** | 2021.12.03 | සිකුරාදා | 2021.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.10 | සිකුරාදා | 2021.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.17 | සිකුරාදා | 2021.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.24 | සිකුරාදා | 2021.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.12.31 | සිකුරාදා | 2021.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |

### 2022 වර්ෂය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 2022.01.07 | සිකුරාදා | 2021.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.13 | බ්‍රහස්පතින්දා | 2021.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.21 | සිකුරාදා | 2022.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.01.28 | සිකුරාදා | 2022.01.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2022.02.03 | බ්‍රහස්පතින්දා | 2022.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.11 | සිකුරාදා | 2022.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.02.18 | සිකුරාදා | 2022.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2022.02.25 | සිකුරාදා | 2022.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.